

**'මා නිවත්ත අභික්කම' - නො නැවත ඉදිරියට යවු**

| | | |
|---|---|---|
| **56 වන කාණ්ඩය** | **බු.ව. 2557 වප් මස පුරපසළොස්වක දා ක්‍රි.ව. 2013 ඔක්තෝබර මස 18 වන දා** | **06 වන කලබ** |

# සත්පුරුෂයා

නටුව මලට කියයි
සිහින් සරින්,
ඔබ පිපෙන්න
ඔබ දිලෙන්න
ලස්සනට සුවඳින් සපිරි ව.
ආවත් නෙක් බඹරුන්, මීමැස්සන්
ගහට නොවේ, හැංගිලා සිටින මට
නොවේ උනට කිසි තැකි ගැන්මක්.
ඔබත් මාත් දැන ගත්තොත් ඒ ඇති
රුවට පිපුණු ඔබ දරන්නෙ මා බව.

බඹරුන් ඔබ වෙත ආවත් සුවඳට
තනි තනි ව ම මල් පැණි බී යන්නට
ඔබේ සුවඳ පතුරනු හැම දන හට
ඔබෙන් කෙරෙන යුතුකම ඒ නටුවට

**- අනඳ**





# අවවාද පිළිගැනීම

**අග්ගමහාපණ්ඩිත අතිපූජ්‍ය වැලිගම ඤාණරතන**
**මහානායක මා හිමිපාණන් වහන්සේ විසිනි**
(සිය දිවි මගේ 101 වන වියට පා තබන අතිපූජ්‍ය මහානායක
මාහිමියන් වහන්සේට උපහාර පිණිස යි)

හොඳ අවවාදය ඉතා වටිනා එකකි. පුහුදුන් හැම දෙනාට ම යහපත් අවවාදය ඉතා ප්‍රයෝජන ය. කෙනෙකු හොඳ අතට හෝ නරක අතට හෝ හරවන්නේ අවවාදය නම් සුක්කානමෙනි. මවුපියන් ගේ අවවාද නො පිළිගන්නා වූ දූ දරුවෝ මවුපියනට කරදර කරන්නෝ වෙති. ස්වකීය ජීවිතය ද නො මඟට හරවා ගෙන විපතෙහි වැටෙති. ගුරුවරුන්ගේ අවවාද නො පිළිගන්නා වූ ශිෂ්‍යයෝ ඒ ගුරුනට කරදර කරන්නෝ ය. ඔවහු තමන්ගේ ජීවිතය ද පිරිහෙළා ගන්නෝ ය. අවවාදය ගරු කොට සලකන පින්වතා කිසි කලෙක පිරිහෙන්නේ නැත. ලෝකයෙහි මෙතෙක් කල් යම් තාක් කෙනෙක් ඔවුන්ගේ අදහස් මුදුන් පමුණුවා ගත්තාහු නම්, ඒ හැම දෙනාම අවවාද ලබාගෙන ඒ අවවාදයනට අනුව පිළිපැද්ද වූ අය වෙති. ගුණ නුවණින් හැදී වැඩී දියුණු වන්නට කැමැති හැමෝ ම අවවාදයට ඉතා ම කැමැත්තෝ ය. එබන්දෝ තමාට අවවාදයක් හෝ අනුශාසනයක් ලැබෙන්නේ කොයි මොහොතෙකැ දැයි නිතොර ම ප්‍රාර්ථනා කරමින් සිටිති.

රාහුල හාමුදුරුවන් වහන්සේ ගැන ඔබ කවුරුත් අසා ඇත. උන් වහන්සේ හැමදම වැලි දෝතක් ගෙන ''මේ වැලි ඇට

ගණනට මට මගේ ආචාර්ය - උපාධ්‍යායයන් වහන්සේලා ගෙන් අවවාද අනුශාසනා ලැබේවා''යි ප්‍රාර්ථනා කරති. අවවාද නො ලබා වරදින් නිදහස් වන්නට නො පිළිවනි. එහෙයින් තමාගේ වරද පෙන්වා දී අවවාද කරන්නා වූ උත්තමයා ගැන කැමැති විය යුතු යි. එසේ තමාට කරුණාවෙන් හා මෛත්‍රියෙන් අවවාද කරන ඒ උතුම් පුද්ගලයා විසින් ''මෙහි නො සිට මෙ තැනින් නික්ම යව''යි කියා තමා එළවා දැම්මත් ඔහු අත් හැර නො යා යුතු බව ''අපි නාසියමානෙන භජිතබ්බො තථාවිධො'' යන ගාථා පදයෙන් තථාගතයන් වහන්සේ දේශනා කළ සේක. එසේ ම වරද පෙන්වා දී අවවාද දෙන තැනැත්තා කොතරම් වටිනා කෙනෙක් දැයි ඔබට මෙයින් ද වටහා ගත හැකි ය.

**නිධීනං ව පවත්තාරං - යං පස්සෙ වජ්ජදස්සිනං**
**නිග්ගය්හවාදිං මෙධාවිං - තාදිසං පණ්ඩිතං භජෙ**
**තාදිසං භජමානස්ස - සෙයොා හොති න පාපියො**

තමාගේ ඇති දෙස් විමසා බලා කියා දෙන තැනැත්තා මහා දුගියකුට නිධානයක් පෙන්වා දෙන කෙනෙකු වැනි ය. වරදට තරවටු කොට අවවාද කරන එ වැනි සත්පුරුෂයකු නිතර ආශ්‍රය කරන්නේ ය. එසේ තමාගේ වරද පෙන්වා දෙන කෙනෙකු ආශ්‍රය කිරීමෙන් තමහට අපමණ යහපතක් වන්නේ ය. නපුරක් අයහපතක් කිසිවිටෙක සිදු නො වන්නේ ය.

මෙයින් ඔබ ගේ වැරැදි ඔබට පෙන්නා දෙන පින්වතා කොතරම් උසස් කෙනෙකු දැයි ඔබට වැටහිය යුතු ය. සැරියුත් මා හිමියන් වහන්සේ පවා තමන් වහන්සේට එදවස මහණ වූ සත්හැවිරිදි සාමණේර කෙනකු විසින් කරනු ලබන අවවාදයක් වේ නම්, ඒ අවවාදය පවා හිස මුදුනින් ම පිළිග න්නා බව ප්‍රකාශ කළහ. ඔබට අවවාද කරන තැනැත්තා කෙබඳු තරාතිරමක කෙනෙකු වුවත් ඔබට ඉන් කමක් නැත. ඔබ ළඟ ඒ වැරැදි තිබේ නම් ඒ අවවාද මුදුනින් පිළිගත යුතු ය.

යම්කිසි කෙනෙකු ගේ වරදක් ගැන අවවාදයක් දුන් කල්හි එය එක වරින් ම පිළිගෙන ඒ වරදින් නිදහස් ව ක්‍රියා කරතොත්, ඔහු සුවචයෙකි. වරදක් ගැන නොයෙක් විට අනුශාසනා කරන්නට සිදු වන්නේ දුර්වචයනට යි.

යහපතක් කියා දෙන්නාක් මෙන් අඟවා අයහපතක් ම නපුරක් ම කියා දෙමින් අවවාද කරන්නෝ ද ලෝකයෙහි කවදත් සිටිති. මුලින් අහිංසක යන නම ඇතිව සිටි හොඳ කුමාරයාට ගුරුවරයා විසින් කළ නපුරු අවවාදය නිසා අංගුලිමාල නමින් දරුණු මිනී මරුවෙක් විය.

ලංකාවේ රජ කළ මහසෙන් රජතුමා නො මඟට හරවන ලද්දේ, ඒ රජුගේ ම ගුරුවරයකු වූ සංඝමිත්‍ර නම් වෛතුල්‍යවාදියකු විසිනි. අවවාද බලාපොරොත්තු වන්නා වූ පින්වතුන් විසින් ඇතැම් විට ආරක්ෂා විය යුතු වූත් සිය සිතට නොගත යුතු වූත් අවවාද තිබෙන බව මෙකී දෙ පුවතින් සිතට ගනු මැනවි. මෙසේ හෙයින් මෙත් වඩන්නට පුරුදු වන්නා වූ ඔබ සිය දියුණුවට අදාළ වන්නා වූ අවවාද පිළිගෙන පළමු කොට තමන් කෙරෙහි මෙත් වඩා සිය වැරැදි දුරුකර ගනිත්වා !



මගේ රට, මගේ ජාතිය, මගේ ආගම, මගේ භාෂාව, මේ මහා'නර්ඝ රත්න සතරක් මට තිබේ. මේ රත්න සතර ආරක්ෂා කර ගැනීම මගේ යුතුකමකි. මෙසේ එක එක සිංහලයා විසින් කල්පනාවට ගෙන සතර අගතියෙන් වෙන්ව ක්‍රියා කටයුතු යි.

**ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමා**



# සියවසක සියපත

බම්බලපිටියේ සිරි වජිරාරාම දහම් පාසලේ නියෝජ්‍ය ප්‍රධානාචාර්ය
**ගෞරව ශාස්ත්‍රවේදී පූජ්‍ය මීගොඩ සුබිත හිමිපාණන් විසිනි**

ගුණ ප්‍රවාලං විනය ප්‍රශාඛං
විශ්‍රම්භ මූලං මහනීය පුෂ්පං
තං සාධු වෘක්ෂං ස්වගුණෛඃ ඵලාඪ්‍යං
සුහෘද් විහඞ්ගාඃ සුඛමාශ්‍රයන්ති

ගුණ නැමැති දළු ඇති, විනය නැමැති අතු ඇති, විශ්වාස කටයුතු බව නැමැති මුල් ඇති, පිදිය යුතු බව නැමැති මල් ඇති ඒ සත්පුරුෂ වෘක්ෂය සිය ගුණයන් කරණ කොට ගෙන ඵලයන්ගෙන් ආඪ්‍ය වූයේ මිතුරු නමැති පක්ෂීහු සුවසේ ඇසුරු කරති.

වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම උන්වහන්සේ ගුණ බර ය. තමා වෙත එළඹෙන ලොකු කුඩා කොයි කවුරුන් කෙරෙහිත් අපමණ දයාවෙන් මඳහස් මුවින් 'ස්වාගත' වචනයෙන් පිළිගෙන කුමන දයකින් හෝ පෙරළා සංග්‍රහ කරන ආකර්ෂණීය ගුණයෙන් උන්වහන්සේ ආඪ්‍යයහ. සිය පහන් දිවි මඟෙහි සියවස පසු කරමින් කායිකව මඳක් අබල දුබලව වැඩ සිටියදී පවා තමා වෙත එළඹෙන කුඩා නමක් වුව නොසළකා නොහරිමින් ''මේ නමට ගිලන්පස ටිකක්'' යැයි ආගන්තුක සත්කාරයෙහි ලා තත්පර වන සැටි අපි අත්දැකීමෙන් දනිමු. තමන් වහන්සේ වෙත පූජා කරන ඉතා කුඩු පිරිකරක් වේවා ඉතා ගෞරවයෙන් සාංඝික සිතිවිල්ලෙන් දෝතින්ම පිළිගන්නා අයුරු පුදුම සහගත ය. එ මතු නොව,

එය බුදු රුවක්, කරඬුවක්, බෝ රුවක් වැනි පූජනීය වස්තුවක් නම් දොහොත් නළලත නඟා සාධුකාර දෙමින් එය පිළිගන්නේ අප්‍රමාණ ශ්‍රද්ධා පූර්වකව ය. වරදෙහි දී ඉතා දැඩි වුවත් කුඩ සාමණේරයන් වහන්සේලා ළංකොටගෙන ළෙන්ගතුව පිය බසෙහි නිරතවන අයුරු දක්නා කල සසුනේ පැවිදි ගුරුවරයා ශිෂ්‍යයා විෂයෙහි පිරිනැමිය යුතු 'පුතු සිත' සිහි ගන්වයි. ධනවාදයෙන් හෙම්බත් ව කාමවාදයෙන් උමතුව ගිහි අසංයත ලෝකයක එක් මානව චරිතයක් තුළ පමණක් මෙබඳු ගුණ සම්භාරයක් විද්‍යමාන වීම විස්මයාවහ ය.

සමස්ත විනය පිටකයට ම පරමාදර්ශය මේ යැයි පෙන්විය හැකි තරමට උන්වහන්සේ විනය ගරුක ය. අණුමාත්‍ර වරදෙහිත් බිය දක්නා සුලු ය. උන්වහන්සේ ගේ වචනය තුළ ඉච්ඡා බස්, රැ වටිලි බස් නැත. කිත් පැසසුම් ලාභ සත්කාර උදෙසා වැනුම් බස්, මුසා බස් එහි නැත. උන්වහන්සේ ධර්මය විනය වෙනුවෙන් කිව යුත්ත කාට නමුත් නොබා පවසති.

උන්වහන්සේ අන් කවරෙකුවත් නොව 2013 ඔක්තෝම්බර් මස 14 වන ද සිය පූජනීය දිවි මගෙහි සියවස පූර්ණය කරමින් එකසිය එක්වන වසරට පා තබන අග්ගමහාපණ්ඩිත පරමපූජ්‍ය වැලිගම ඥාණරතන මහානායක මාහිමිපාණන් වහන්සේ ය.

1913 ඔක්තෝම්බර් මස 14 වන ද විරුවන් ගේ ජාත භූමිය වූ රුහුණේ වැලිගම වල්ලිවෙල දී ඕදිරිස් සිල්වා මහෝපාසකතුමාට හා බබුන්හාමි මහෝපාසිකාවට දව බාලම දරුවා ලෙස උපත ලද අප මහානායක මාහිමිපාණන් වහන්සේ ගිහි කල 'කරෝලිස් සිල්වා' යන නාමය ලදහ. සංයත ඉරියව්වෙන් මහ මඟ වඩින පැවිදි රුවක් දුටු කල උන්වහන්සේලා ගේ සෙවණැල්ල හෝ නොපෑගෙන සේ ආසාවෙන් පසු පස යෑම තරම් මේ පුංචි සිත කසාවතට බැතිබර විය. විශාල සාංසාරික පින් බලයක් උරුම කොට උපදින චරිත සිය කුඩා කල දී තරමක දඟකාර ස්වභාවයක් ප්‍රකට කෙරෙන බව එවැනි මහා පිනැතියන් ගේ චරිතාධ්‍යයනයේ දී පෙනේ. අප මහනාහිමි සිරිතෙහි ද ළපැටි කල එම දඟකාර

බව පැවැති අයුරු කුඩා වියේ රස කතා සිහි කරමින් සිනහ පිරි මුවින් මහ නා හිමියෝ වදරති.

සිය පුතුගේ පැවිදි වීමේ දැඩි ඇවටිල්ලට අවනත වන්නට දෙමාපියන්ට සිදු විය. මැණියන්වහන්සේ අප්‍රමාණ දුක් කඳුළු වගුරවමින් සිය ආදරණීය බාල පුතණුවන් සසුනට පූජා කළෝ ය. පුර පස සඳ මඬල මෙන් කෙමෙන් මෝරා වැඩුණු ඒ සැදැහැ සිතේ පූජනීය ප්‍රාර්ථනාව මල් ඵල ගන්වමින් මේ පින්බර කුල කුමරුවාණෝ 1925 නොවැම්බර් 30 වන ද අහංගම එළුකැටිය බිම්බාරාම මහා විහාරයේ දී දෙවුන්දර ශ්‍රී ධම්මානන්ද මාහිමිපාණන් වහන්සේ ගේ උපාධ්‍යායත්වයෙන් හා අහංගම සිරි විමලසාර මාහිමිපාණන් වහන්සේ ගේ ආචාර්යත්වයෙන් වැලිගම ඤාණරතන නමින් සසුන් ගත වූහ.

අව් වැසි සුළං අකම්පිතව ඉවසන ඒකඝන පර්වතයක් සේ නොයෙක් දුක් ගැහැට වළඳමින් නමුත් ගුරු ඇසුරෙහි සඳ සතර උගෙන පසුව ලක්දිව මහා ධර්ම ශාස්ත්‍ර පීඨය වූ විද්‍යෝදය මහ පිරිවෙනේ වර්ගපටිපාටියෙන් අධ්‍යාපනය ලබා ඉනුත් ඔබ්බට ගොස් රාජකීය පණ්ඩිත උපාධිය ද ලබා ගත්හ. කීර්තිමත් විද්‍යෝදය ආදි සිසුවෙකු වූ අප මහ නාසමිඳාණෝ පසු කලෙක විද්‍යෝදය පිරිවෙනින් පිරිනමන ලද 'ශ්‍රී සුමංගල විද්‍යාවතංස' ගෞරවෝපහාරයෙන් ද සම්මානිත වූ සේක. 1933 ජූනි 09 වන ද පැළෑණේ ගංගාරාමාසන්න උදකුක්ඛේප සීමාවේ දී සුපරිශුද්ධෝපසම්පදා භූමියට පත් මේ ශික්ෂාකාමී තරුණු පඬි හිමිපාණන් වහන්සේ ගේ දිවි මගෙහි නව දිශානතියක් ඇරැඹෙන්නේ එකල ලක් සසුන් අහසෙහි පිවිතුරු සඳ මඬලක් බඳුව වැඩ හුන් පරම පූජනීය පැළෑණේ සිරි වජිරඤාණ මහනා හිමිපාණන් විසින් වජිරාරාමයට ඇවිත් නතරවන ලෙස කරන ලද ආරාධනාවත් සමඟ ය.

නූතන ශාසනික ප්‍රබෝධයෙහි කේන්ද්‍රස්ථානයක් ලෙස සැළකෙන වජිරාරාම පුණ්‍ය භූමියේ දී 'වජිරාරාමවාසී' බව ගෞරවෝපාධියක් තරමට ගෞරවාන්විත වූ යුගයක දී පැළෑණේ

මහ නා සමිඳුන් ගේ ගුරු ඇසුරත්, නාරද මාහිමි, මඩිහේ මාහිමි, මහානාම මාහිමි, අම්පිටියේ රාහුළ මාහිමි, පියදස්සි මාහිමි, සෝම බ්‍රේමින්ද මාහිමියන් වහන්සේලා වැනි උතුමන් වහන්සේලා ගේ සම්භක්ත සහෝදර සදශ්‍රය ද නිසා සිය පැවිදි දිවිය වඩාත් පින් සරු කොට ගත් 'භික්ෂුත්වය' සම්බන්ධයෙන් නොලිහිල් ඉතා සෘජු ථේරවාද සම්ප්‍රදය ගරුක ප්‍රතිපත්තියක සිටින අප මහ නාහිමිපාණන් වහන්සේ ගේ එම ආකල්පය සත්‍ය ලෙසම, භික්ෂුත්වයේ මූලික පවුරු පදනම් දෙදරා යමින් තිබූ අවදියෙක වජිරාරාම සම්ප්‍රදය විසින් යළි සුගෝපිත කරවන ලද මූලික භික්ෂු ආකෘතියෙන් ම සුපෝෂිත වූවක් බව පෙනෙයි. වජිරාරාමවාසී භාවය විසින් මහනාහිමි දිවියට කළ සුවිශේෂතම බලපෑම මේ යැයි විද්වතුන්ගේ අදහසයි. එය උදක්ම පෞද්ගලිකව මහනාහිමි දිවියට මතු නොව පසු කලෙක උන්වහන්සේ ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ද පොදුවේ අමරපුර ධර්මරක්ෂිත නිකායට ද භික්ෂුත්වය පිළිබඳ පැහැදිලි ආකල්පයක් ඇති කිරීමට සමත් විය. අප මහනාහිම්පාණන් වහන්සේ අදටත් 'සිරි වජිරාරාම'' නාමය මහත් කෘතඥතා පූර්වක බැතියෙන් සිහිපත් කරන්නේ එහෙයිනි.

පැළෑණේ මහානායක මාහිමිපාණන් වහන්සේ අපවත් වීමෙන් පසුව සිය සසුන් මෙහෙවරෙහි ජය භූමිය වූ රත්මලානේ මල්ලිකාරාම මහා විහාරය ආරම්භ කරමින් එහි වැඩම කළ අප මහ නා හිමිපාණෝ වියත් ලොව ජය කෙහෙළි නැංවූ ගිහි පැවිදි සිසු පුතණුවරුන් බොහෝ දෙනෙකුට ප්‍රවර ඇදුරුපාණ කෙනෙක් වූ සේක. උන්වහන්සේ ලක් සසුනේ නිල නොලත් සංඝ රාජයන් වහන්සේ යැයි හැඳින්වුණු මඩිහේ පඤ්ඤාසීහ මහානායක මාහිමිපාණන් වහන්සේ අපවත් වන තුරුම උන්වහන්සේ සමගත් දැනට සියවස් විය අබියස වැඩ සිටින අම්පිටියේ ශ්‍රී රාහුළ නාහිමිපාණන් වහන්සේ සමඟත් මහත් කල්‍යාණ මිත්‍ර බැඳීමකින් ක්‍රියා කළ සේක. විශේෂයෙන් අපවත් වී වදළ මඩිහේ පඤ්ඤාසීහ මහානායක මාහිමිපාණන් වහන්සේ අප මහ නාහිමිපාණන් වහන්සේට වඩා පැවිද්දෙන් වැඩිමහලු ය. නමුත් අප මහනාහිමිපාණන් වහන්සේ උන්වහන්සේට වඩා උපසම්පදාවෙන්

පැය කිහිපයක් වැඩිමහලු ය. මේ ශාසනික වැඩිමහලු කම් නිසා මිත්‍රත්වය අබිබවා යමින් දෙදෙනා වහන්සේ දෙදෙනා වහන්සේට මහත් ගෞරව සම්ප්‍රයුක්ත වූ සේක.

දර්ශන මාත්‍රයෙන් ම පුරාණ මහරහතන් වහන්සේලා ගේ යුගයේ වැඩ සිටි අපිස් සතොස් මහනීය මහ තෙර නමකගේ ස්වභාවය මේ යැයි සිහිගන්වන නොසිඳුණු පෞරුෂයකින් හෙබි මහ නාහිමිපාණෝ විනයධරත්වයෙන් අග්‍රේසරය හ. බෞද්ධ විනය සම්ප්‍රදය පිළිබඳ සිය ආචාර්ය උපාධිය නිම කළ අභාවප්‍රාප්ත ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ආනන්ද සී ග්‍රේරු මැතිතුමන් වරක් ප්‍රකාශ කළේ විනය සාහිත්‍ය පිළිබඳ වර්තමාන ථෙරවාද භික්ෂු සම්ප්‍රදය නියෝජනය කරන විශිෂ්ටතම විශාරද ඥානය උන්වහන්සේ සතු බවයි.'' පොහොය, පවාරණ, උපසම්පද ආදී විනය කර්ම විෂයයෙහි උන්වහන්සේ මහත් ගෞරව සම්ප්‍රයුක්තය හ. අදටත් නිකායික විනය කර්මාදිය ශාසනික සම්ප්‍රදය නොඉක්මවා අකුරටම සිදුවන්නේ උන්වහන්සේ ගේ අධීක්ෂණය යටතේ ය. වියත් බවින් පමණක් නොව ''ඛේමී අවේරී අභයෝ පණ්ඩිතෝ '' කියූ ලෙසම ස්ථාවර බව, මෛත්‍රිය හා අවිහිංසක බව යන ගුණයෙන් ද උන්වහන්සේ පණ්ඩිත වන සේක.

උන්වහන්සේ ම දක්වන පරිදි තමාට තමා ම චෝදනා කරන අත්තානුවාද භයින් තොරව අහෝ සුබං යැයි උදම් අනමින් සිය සුසංයත සුනිමල සුශෝභිත පින්සරු පැවිදි දිවියම අභිරමණය කරමින් සියවසක් ඉක්මවමින් වැඩ සිටින උන්වහන්සේ නිරාමිස තුටු සිතින් වැඩ හිඳිති. අප මහ නා හිමිපාණන් වහන්සේ ගේ එකම පැතුම නිවන් දක්නා තුරුම උපදින උපදින වාරයක් පාසා පැවිද්දම වේවා යන්නයි.

ඒ සම්‍යක් ප්‍රාර්ථනාවට අපිදු බැතිබර වෙමින් 2013 ඔක්තෝබර 14 වන ද එකසිය එක්වන වියට පාතැබූ අමරපුර ධර්මරක්ෂිත මහා නිකායේ මහානායක ධුරීණ අග්ගමහාපණ්ඩිත විනය විශාරද, ධර්ම කීර්ති ශ්‍රී සුමංගල විද්‍යාවතංස ආචාර්ය වැලිගම ඤාණරතන අප නාහිමිපාණන් වහන්සේට නිදුක් නිරෝගී සුව දිගාසී වේවා යි පතමු !



ගුණ මිණි ආර -11

# ගුරු ගෞරවය

**'ගුරු සීයා' විසිනි**

ගුරුවරයා යන වචනයෙහි අදහස ගරු කළ යුතු තැනැත්තා, ගෞරවනීය පුද්ගලයා යන්න යි. ඒ, සමාජයට ඉතා බරපතළ, ඉතා උසස් කාර්යයක් ඉටු කර දෙන පුද්ගලයා වන නිසා ය. පැරැණි පෙරදිග/අපරදිග සංස්කෘතික සම්ප්‍රදායවල ගුරුවරයාට සුවිශේෂ ගෞරවයක් හිමි කරන ලද්දේ ඔහු/ඇය මනුෂ්‍යත්වය, ධර්මය, ව්‍යවහාර ඥානය හා ශිල්පීය ඥානය ලබා දෙමින් උතුම් මිනිසකු නිර්මාණය කරන නිසා ය. තෛත්තිරීය උපනිෂදයෙහි ''ආචාර්ය දෙවො භව'' ගුරුවරයා දෙවියකු කොට සලකන්නැ යි කියා ඇත්තේ මේ නිසා ය. ශ්‍රේෂ්ඨ ගුරුවරයකුට 'ගුරුදේව' - 'ගුරු දෙවි' කියා අමතන්නේ ඒ උතුම් ගෞරවනීය සේවාව සලකාගෙන ය.

බෞද්ධයන් වන අප සලකන හැටියට මෙලොව පහළ වූ ශ්‍රේෂ්ඨතම ගුරුවරයාණෝ බුදුරජාණන් වහන්සේ ය. උන් වහන්සේ මිනිසුන් ගේ පමණක් නොව දෙවියන් ගේ ද උත්තම ගුරුවරයා ය (සත්ථා දේවමනුස්සානං). ශ්‍රේෂ්ඨ ශාස්තෘවරයකු ලෙස මුළු මහත් සත්ත්වයාට උන්වහන්සේ විසින් සිදු කර ඇති ශාන්තිමත් සේවාව අනුපම ය. අසම සම ය. අත්‍යුදාර ය. බුදු පියාණන් වහන්සේ පිරිනිවන් පාන්නට සූදානම් වන අවස්ථාවෙහි

''ශ්‍රාවකයනට (ගෝලයනට) හිතවත් බව ඇති ගුරුවරයකු විසින් යමක් කළ යුතු ද, ඒ දෙය ම-විසින් සිදු කර ඇත'' යනුවෙන් කර ඇති අනුවේදනීය ප්‍රකාශය උන් වහන්සේ ගේ අසහාය ගුරු භූමිකාවෙහි උත්තරීතර උදාහරණය වැන්න. ඕනෑම ගුරුවරයකු වේවා, ගුරුවරියක වේවා මේ ශ්‍රේෂ්ඨ උදාහරණය හදවත්වල නිදන් කරගෙන සිය මෙහෙය ඉටු කරන්නේ නම් ඉතා සාර්ථක ගුරුවරයකු/ගුරුවරියක වනු නොඅනුමාන ය.

'කාලිකා පුරාණය' නමැති ග්‍රන්ථයෙහි මෙ බඳු අදහසක් දක්වෙයි. 'ගුරුවරයා මන්ත්‍රයෙහි මුල ය. මුල හොඳ නම් සියල්ල හොඳ ය.' (මෙහි මන්ත්‍ර ශබ්දයෙන් ධර්ම ශාස්ත්‍ර ශිල්ප කලා සියල්ල ම ගැනේ) ගුරුවයා යහපත වන කල ශිෂ්‍ය ප්‍රජාව හා සමස්ත සමාජය ම යහපත් වන බව මෙයින් ගම්‍යමාන වන අරුත යි.

සිගාලෝවාද සූත්‍රයෙහි දක්වෙන පරිදි, ගුරුවරයා විසින් කරුණු පහකින් ශිෂ්‍යයාට අනුකම්පා කළ යුතු ය.

1. මැනැවින් හික්මවීම 2. මැනැවින් ඉගැන්වීම 3. සියලු සිප් සතර (අඩු නො කොට) කියා දීම 4. මිත්‍ර-අමාත්‍යයනට (සමාජයේ පිළිගත් ප්‍රභූවරුනට) හඳුන්වා දීම 5. හැම අතෙකින් ම ආරක්ෂාව සැලැස්වීම යනු ඒ කරුණු පහයි. එ ලෙසින් ම ශිෂ්‍යයා විසින් කරුණු පහකින් ගුරුවරයාට උවටැන් කළ යුතු බව බුදු පියාණන් වහන්සේ එම සූත්‍රයෙහි වදරති. ඒවා නම් 1. ගුරුවරයා දක හිඳ ගත් අසුනින් නැඟිටීම 2. උපස්ථාන කිරීම 3. උගන්වන දැට මැනැවින් ඇහුම්කන් දීම 4. වතාවත් කිරීම 5. මැනැවින් ශිල්ප ශාස්ත්‍ර සකසා පිළිගැනීම. එසේ ම ගුරු - ශිෂ්‍ය දෙදෙනා ම පිය - පුතු සෙනෙහස ඇති ව ක්‍රියා කළ යුතු බව ද ධර්මයෙහි සඳහන් කර ඇත. මෙසේ ක්‍රියා කරන ගුරු- ශිෂ්‍ය දෙදෙනා ම එකිනෙකාට ගෞරව ඇති ව, එකිනෙකාට පිහිට ඇතිව, එකිනෙකාට ගැළපෙන පැවැතුම් ඇතිව ක්‍රියා කරන බව බුදුපියාණන් වහන්සේ දේශනා කර ඇත.

වර්තමානයෙහි ගුරු-සිසු සබඳතා බිඳ වැටී ඇත්තේ, නැත හොත් බෙහෙවින් දුර්වල ව ඇත්තේ ඉහත සඳහන් ගුරු - සිසු ගෞරවනීය සබඳතාවන් නොතකා හැර ක්‍රියා කිරීම නිසා ය. ශිෂ්‍යයා කෙරෙහි දැක්විය යුතු කාරුණිකත්වයට වඩා වෘත්තීය අපේක්ෂා ගුරු භූමිකාව තුළ ඉස්මතු වීගෙන එයි. ශිෂ්‍යයා හද ගැනීම, දැනුමෙන් උසස් තැනකට පමුණුවා ලීම ගැන අද ගුරුවරයා කල්පනා නො කරයි. ශිෂ්‍යයා ඉගෙන ගත්තත් නැතත් පාඩම ඉගැන්වීම තමා ගේ කටයුත්ත ලෙස ගුරුවරයා සිතයි. (මෙසේ නොවන උත්තම ගණයේ ගුරු දෙව්වරුන් තවමත් අප අතර නැතුවා නොවේ.)

මෙවැනි පසුබිමක් තුළ යහපත් ගුරු-සිසු සබඳතා වර්ධනව වේ යැයි අපට සිතිය නොහැකි ය. එකල අධ්‍යාපනය හා මිල මුදල් අතර තරගකාරී ගනුදෙනුවක් නොවී ය. අද අධ්‍යාපනයට ඉහළින් නැඟී සිටින්නේ මිල මුදල් ය. 'ටියුශන් ' සංස්කෘතිය නිසා මේ තත්ත්වය වඩාත් උග්‍ර අතට හැරී ඇත.

ශිෂ්ටත්වය ඇති ඕනෑ ම ජන සමාජයක ගුරුවරයා ගේ භූමිකාව අතිශයින් ම සම්භාවනීය වේ. ගුරුවරයා ගේ ආදර්ශය එහිලා ප්‍රධාන වේ. ගුරුවරයා ගේ පෞරුෂය ද සුවිශේෂ වැදගත් කරුණෙකි. පෞරුෂය යන්නෙන් අදහස් කැරෙන්නේ කායික පෘථුල භාවය පමණක් නොවේ. ගුරුවරයා ගේ යහපත් චරිතය, ඍජු ගුණය, ශිෂ්‍ය දයානුකම්පාව, මනෝවිද්‍යානුකූල ව ශිෂ්‍යයා අවබෝධ කර ගැනීම, ශිෂ්‍යයා දැනුමෙන් ඔසොවා තැබීමේ අභිලාෂය, අභිමානය, පැහැදිලි ලෙස , නිරවුල් ලෙස, නිවැරැදි ලෙස දැනුම ලබා දීම, ශිෂ්‍යයා දක්ෂ ලෙස ශාස්ත්‍රයෙහි කැපවීමෙන් ප්‍රගුණ කරවීම යන මේවා ද ගුරු පෞරුෂයෙහි ප්‍රතාපවත් භාවය පෙන්නුම් කරන කරුණු ය. හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි, රත්මලානේ ශ්‍රී ධර්මාරාම නාහිමි, පැළෑණේ සිරි වජිරඤාණ මාහිමි, වැලිවිටියේ සෝරත නාහිමි, කුමාරතුංග මුනිදාස මහතා, එල්. එච්. මෙත්තානන්ද මහතා, පී. ද එස්.

කුලරත්න මහතා ආදීහු එබඳු සැබෑ ගුරු දෙවිවරු වූහ. ඒ උතුමන් බිහි කළ ශිෂ්‍යයෝ අප්‍රමාණ ගුරු ගෞරවයෙන් යුක්ත වූවාහු ය.

සමාජය යහපත් අතට ප්‍රතිනිර්මාණය කිරීම සඳහා ගුරු භක්තිය සහ ගුරු ගෞරවය ද සහිත ශිෂ්‍ය ප්‍රජාවක් රටට අවශ්‍ය ය. ගුරුවරයාට කවටකම් කරන, හිංසා කරන, ගුරුවරයාට විරුද්ධ ව සත්‍යග්‍රහ - උපවාස කරන, ගුරුවරයාට සිර දඬුවම් දෙන ශිෂ්‍ය ප්‍රජාව රටට අවමානයකි. ගුරු ප්‍රජාව ද ඊට වග කිව යුතු වන බව අමුතුවෙන් කිව මනා නොවේ.

ගුරු ගෞරවය වනාහි ගුරු-ශිෂ්‍ය සුසබඳතාවේ සංවේදනීය සංකේතයකි. එය ශිෂ්‍යයාට ආශීර්වාදයක් ද ගුරුවරයාට අභිමානයක් ද වේ. ගුරු ගෞරවය ඇති තැන හදවත ගුණයට ද සෞන්දර්යයට ද ආස්ථානයක් වේ. මනුෂ්‍යත්වයේ වෘක්ෂය කරුණාවේ මල්-පලවලින් ශෝභමාන ව සුහුඹුල් ව වැඩේ. ඥානයේ මාණික්‍යය දයාවේ ආලෝකයෙන් දීප්තිමත් වේ. මානව භක්තියේ පුෂ්පය විශ්වාසයේ සුගන්ධයෙන් සුරම්‍ය ලෙස සුපුෂ්පිත වේ.

ගුරු ගෞරවය හා ගුරු භක්තිය ඇති සිසු දරු පෙළක් ගුණෙන්-නැණින් පෝෂණය කොට සමාජයට එළි දක්වන්නට උත්තම ගුරු භවතුනට අපි ඉත සිතින් ආරාධනය කරමු.



# අම්බ ජාතකය

කොළඹ විශාඛා විද්‍යාලයේ විශ්‍රාමලත් ආචාර්යාණි
**ලක්ෂ්මී පෙරේරා මහත්මනිය විසිනි**

එකල ශාසනයෙහි බොහෝ පිළිවෙත් සරු භික්ෂූන් වහන්සේලා වැඩ සිටියහ. බුද්ධෝත්පාද සමය වන මෙකල ද පිළිවෙත් සරු භික්ෂූහු වැඩ වසති. ඒ ඉතා ශ්‍රද්ධාවෙන් යුතුව වත් පිළිවෙත් අනුගමනය කරන්නා වූ භික්ෂූන් වහන්සේලා ය.

අප සම්මා සම්බුදුපියාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වාසය කරන කල්හි එක් පිළිවෙත්සරු භික්ෂුවක් වෙනුවෙන් අම්බ ජාතකය දෙසූ සේක.

මෙම භික්ෂූන් වහන්සේ ශාසනයට ඉතා ලැදි වූහ. මහ පිළිවෙත් සතළිහක් හා සියුම් පිළිවෙත් අසූවක් පිරූහ. බෝධි මළුව හා සලපතළ මළුව ඇමදීම, ධර්මශාලාව සහ සංඝාරාම පිරිසිදු කිරීම, කිසිම අසතුටක් නොමැතිව ඉටු කළහ. පින්තාලි තැබීම, පොකුණු පිරිසිදු කිරීම කුසීත බවකින් තොරව කළහ. මෙයින් සතුටට පත් උපාසකවරු භික්ෂූන් වහන්සේලා උදෙසා පාත්‍ර පන්සියයක් පූජා කළහ. බොහෝ භික්ෂූහු එම දනය පිළිගත්හ. බුදුරජාණන් වහන්සේ ගේ ප්‍රධානත්වයෙන් දම් සභාව රැස් වූ විට දිනෙක මාතෘකාව වූයේ මෙම පිළිවෙත් සරු භික්ෂූන් වහන්සේ ය. උන්වහන්සේ ගේ ආදර්ශවත් බව ගැන ය. ගුණ ගැන ය. ඒ සියලුම භික්ෂූන් වහන්සේලා සත්කාර ලැබුයේ උන්වහන්සේ නිසා බැවිනි.

අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ අනෙක් භික්ෂූන් වහන්සේලා අමතමින් මෙම භික්ෂුව පෙර කල පවා ඉතා හොඳින් වත් පිළිවෙත් රැකීම නිසා, උන්වහන්සේට පමණක් නොව අන් අයටත් සත්කාර ලැබිණැයි වදාළහ.

ඈත අතීතයේ බරණැස් නුවර බඹදත් රජු රාජ්‍ය කරනා කල, අප මහ බෝසතාණෝ පන්සියයක් තාපසවරුන් සමඟ හිමාල වනයෙහි වාසය කළහ. මෙකල ඉතා දරුණු නියඟයකට රටෙහි ගිහි-පැවිදි සැමටම මුහුණ දීමට සිදුවිය. ගස් වැල් වියළී ගියේ ය. ළිං, පොකුණු. ඇළ දොල සිඳී ගියේ ය. මිනිසාට මෙන් සතා සීපාවාට ද බීමට පැන් පොදක් සොයා ගැනීම අසීරු කාර්යයක් විය. එක් තාපස කෙනෙක් සතුන්ගේ දුක දැක විසඳීමට මඟක් සෙවී ය. තිර අදිටනක් ඔස්සේ විසඳුමක් සෙවීමට උන්වහන්සේ ඉටා ගත්හ. පළමුව ගසක් කපා එහි කඳ කොටස දික් අතට හාරා ඔරුවක් ලෙස සකස් කළහ. දිය කඳුරක් සොයා ගිය තාපසතුමා තමන්හට ආශ්චර්යවත් ලෙස දකින්නට ලැබුණු දියෙන් කාහටත් උදව් කරන්නට සිතුහ. ටිකෙන් ටික ඉතා අසීරුලෙස දිය ගෙනවිත් තාපසතුමා ඔරුව පිරවූහ. පැන් පොදක් නොලැබ පිපාසාවෙන් පසු වූ පක්ෂීන් හා සත්තු පැන් බී සැනසුණහ. පැන් ගෙනෙන්නට යෑම නිසා තාපසයනට ආහාර එනම් පලවැල සොයා ගැනීමට නොහැකි බව පක්ෂිහු දුටුවෝ ය. තාපසතුමා තම ශක්තියෙන් හා වීර්යයෙන් පැන් ගෙන ආ ලෙසින් ම පක්ෂිහු වනාන්තරය පුරා පියාඹමින් පලවැල ගෙනවිත් ගොඩ ගැසූහ. ගැල් ගණනාවක් පුරවන්නට තරම් පළතුරු ගෙන ආහ. හිමාල වනයෙහි වැඩ සිටි තාපසයනට ද නියඟය බලපා තිබුණි. නමුත් උන්වහන්සේලාට කුස ගින්නේ සිටීමට සිදුනොවී ය. මන් ද? කුරුල්ලන් ගෙන ආ පළතුරු ඕනෑවටත් වඩා තිබූ බැවිනි. මෙය දුටු අප මහ බෝසතාණෝ තාපසයන් ගේ ගුණ අගය කළහ.

බුදුහු මෙම අම්බ ජාතකය දම් සභාවෙහි සිටි භික්ෂූන් වහන්සේලාට වදරා වත් පිළිවෙත් රැකීමේ සහ වීර්යවන්ත කමෙහි ආනිසංස පැවසූ සේක. පැවිදි උතුමෙකු වුවත් ගිහියකු වුවත් හොඳින් වත් පිළිවෙත් රැක වීර්යය වැඩිය යුතු ය. එය අත් නොහැරිය යුතු ය. එවිට අන් අයගෙන් පුද සත්කාර ලැබෙන බව ඉඳුරාම පවසා සිටි සේක. අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ එකල දුන් අවවාදය අදට ද මනාව ගැලපේ.

ඈත අතීතයේ පැන් ඔරුව සාද පැන් පිරවූ තාපසයෝ මෙකල පිළිවෙත් ගරු භික්ෂූන් වහන්සේ ය. නායක තාපසයා බුදුරජාණන් වහන්සේ ම බව වදාළ සේක.

අපි ද ධෛර්ය කිසි විටක අත් නොහැරීමට ඉටා ගනිමු.

"හොඳින් පදම් කළ හම කැමැති අතකට නමා කැමැති කටයුත්තෙක යෙදිය හැකි වන්නාක් මෙන් ද, හොඳින් උණු කොට තවා ගත් පිරිසුදු රත්රන් කැමැති උසස් කර්මාන්තයෙක යොදා ගත හැකි වන්නාක් මෙන් ද, මෘදු ගුණ ඇති ළමයා මෙලොව දියුණුවෙහි වුවත් පරලොව දියුණුවෙහි වුවත් කැමැති උසස් කටයුත්තෙක යෙදිය හැකි වේ. **එහෙයින් මෘදු ගුණ ඇති ළමයා පිරිසුදු රන්පිඩෙකි"**

**අතිපූජ්‍ය පැළෑණේ සිරි වජිරඤාණ**
**මහ නා හිමිපාණෝ**

(කෙටි කතාව)



# මලක සුවඳ

සිරි වජිරාරාමවාසී
**පූජ්‍ය පිටිපන සාසනරතන හිමිපාණන් විසිනි**

පුංචි දුවේ පුතේ කවුද ඔබට වැඩියෙන් ම ආදරේ කියල මම ඇහුවොත් ඔයාලා කියයි අම්මා තමයි වැඩියෙන් ආදරේ. තවත් සමහරු කියයි තාත්තා ගොඩක් ම ආදරේ කියලා. හැබැයි මම කියනවා දෙමාපියන්ටත් වඩා පුංචි ඔයාලාට මේ ලෝකේ ගොඩාක් ආදරේ කරන කෙනෙක් ඉන්නවා කියලා. ඒ වෙන කවුරුත් නෙමේ, අපි හැමෝගේ ම ශාස්තෘ වූ බුදු හාමුදුරුවෝ. මෙහෙම වෙන්නේ ඇයි කියලා දන් නෙමේ පුංචි ඔයා තව ටිකක් දනුම් තේරුම් ඇති කෙනෙක් උනාම වැටහේවි. මම කෙටියෙන් මේ ගැන විස්තර කරලා දෙන්නම්. නරක ගැන නපුරු වැඩවල යෙදුනහම ඒවයේ විපාකත් දරුණු ලෙස අපේ ජීවිතවලට ලැබෙනවා. මේවා අපට දේශනා කළේ බුදුහාමුදුරුවෝ විතරයි. සසරේ මෙච්චර කාලයක් ඉපදි ඉපදි මැරි මැරි ආවා තවත් කොතරම් කලක් එහෙම ගමන් කරන්න තියෙනවද කියල අපි කවුරුවත් ම දන්නේ නැහැ.

මේ බව වටහාගත් බුදුහාමුදුරුවෝ සසර ගමන නතර කරගන්න මාර්ගය සොයා ගත්තා. ඉන්පසු අපට එය දේශනා කළා. මෙන්න මේ හේතුව නිසාමයි බුදු හාමුදුරුවෝ අපට ගොඩක්ම ආදරේ කියල මම කිව්වේ. ඒ වගේ දුකින් පෙළෙන

සත්වයාව දුකින් මුදවන්න මේ ලොවේ සැබෑ තතු වටහා ගන්නට අග්ගඤ්ඤ සූත්‍රය ගොඩක් ම ඉවහල් වෙනවා.

පොඩි හාමුදුරුවෝ බොහෝ කලෙක පටන් මේ කතාව පුංචි ඔයාලට කියා දෙනවා. පසුගිය කලාපයෙන් මේ ලෝකයේ හොරකම ඇතිවූ හැටි කියා දුන්නා. ඉතින් අද එතැන් සිට.....

දැන් හැල් වී හොරකම් කරන පිරිස වැඩි උණා. මුලදී සොරකම් කරන අය අල්ලගෙන ඔවුන්ට අවවාද කළා. හැබැයි හොරු කවදවත් අවවාද පිළිපදින අය නොවන නිසා තව තවත් මේ අය හොරකමට නැඹුරු උණා. අවවාද කළාට වැඩක් නොවන නිසා අපි මේ හොරුන්ට හොඳ පාඩමක් උගන්වමු කියල අනෙක් පිරිස කතිකා කරගත්තා.

එක් දවසක් මේ පිරිස ගල් පොලු අරගෙන හැල් වී කෙත් අසල සැඟවිලා බලන් හිටියා. ඊට පස්සේ සොරු පිරිස අල්ල ගත්තා. හොඳටෝ ම දඬු මුගුරු වලින් පහර දුන්නා. මහ විශාල ගුටි බැට හුවමාරුවක් සිදු වුණා. එන්න එන්නම මේ කලකෝලාහල වැඩි වුණා. හොරු වගේ ම අනෙක් පිරිසත් බොහෝම පීඩාවට පත් වුණා.

දැන් මේ ලෝකේ සත්වයාගේ ගති සිරිත් දවසින් දවස තවත් නරක තත්වයට හැරෙන්න ගත්තා. හොර සතුරු බිය දවසින් දවස වැඩිවුණා මිසා අඩුවුණේ නම් නැහැ.

මේ විදිහට සත්වයෝ එකිනෙකා ඇන කොටා ගන්න එක මේ සොබාදහමට දරන්න බැරි උණා. සොබා දහමේ මූලින් පැවති ඒ අසිරිය ටික ටික අඩුවුණා. පරිසරය රළු වුණා. කර්කශ වුණා. සොබා දහමේ වටිනා දයාද සම්පත් සිඳී යන්නට පටන් ගත්තා

ලබන කලාපයට....



# ලොව ලස්සන වන්නට

විශ්‍රාමලත් ආචාර්යාණී
**ලක්ෂ්මි කරුණානායක මහාත්මනිය විසිනි**

සුසන්තිකා තම මල් වත්ත නරඹමින් මේ ලෝකයේ කොපමණ ලස්සන දේ තියෙනවද? කියා සිතුවා ය.

මල්, කුරුල්ලන්, සමනලුන්, අහස, කඳු, වලාකුළු, සුළඟ, ගස්, දේදුන්න, මුතු මැණික්, මුහුද මේවායින් වඩාත් ලස්සන මොනවාදැයි කල්පනා කරන්නට විය.

එවිට ඇගේ වැඩිමහල් සොයුරිය එතැනට පැමිණියා ය. අක්කේ ! මේ ලෝකේ ලස්සනම දේ කුමක් ද?

නංගි ඔය ප්‍රශ්නය මගෙන් ඇසුවේ නිවැරදි පිළිතුරක් ලැබෙයි යන විශ්වාසයෙන් නේ?

ඔව්, නිවැරදි පිළිතුරක් ලැබුණොත් අක්කාට මං ගොඩක් ආදරෙයි.

නංගි, විශ්වාසයත් ආදරයත් ලැබුණ තැන සාමය ඇතිවෙනවා. අන්න ඒක තමයි ලෝකේ ලස්සනම දේ.

නංගි දහම් පාසලට යන නිසා පස්වග තවුසන්, බුදුහාමුදුරුවන් ගැන දන්නවා නේ.

අපේ බුදුපියාණන් වහන්සේ පස්වග තවුසන්ට ධර්මය දේශනා කරන්නට පැමිණි වේලාවේ සිද්ධාර්ථ තාපසතුමා බුදුවුණා කියලා

විශ්වාස කළේ නැහැ. බුදුපියාණන් කෙරෙහි විශ්වාසය ඇති වනතෙක් පස්වග තවුසන්ට දහම් දෙසුවේ නැහැ.

බුදුපියාණන් කිසි දිනෙක මුසාවක් පවසා නැති බව පස්වග තවුසන්ට අවබෝධ වීමෙන් පසුව විශ්වාසය ගොඩනැගුණා.

ඒ සමගම බුදුපියාණන් කෙරෙහි ආදරයක් සෙනෙහසක් ඇති විය. සාමකාමී පරිසරයක් තුළ දහම් දෙසුහ. ඒ දහම් අසා තවුසෝ නිවන් අවබෝධ කර ගත්හ. එද සිට සංඝ ශාසනය ඇති විය. ඒ නිර්මල සද්ධර්මය අද දක්වා පවතින්නේ විශ්වාසය ආදරය සාමය මතයි.

ලෝකය ලස්සන වන්නේ විශ්වාසය ආදරය සාමය මතයි.

දුවේ, පුතේ දෙමාපියන් ළමයින් පාසල් යවන්නේ රටට දැයට වැඩ ඇති පිරිසක් කිරීමේ විශ්වාසය උඩයි. ළමයින් පාසල් යන්නේ ගුරුතුමා තමන් දැනුම්වත් කරයි යන විශ්වාසය මතයි.

ගුරුතුමා උගන්වන්නේ තමන් කියා දෙන දේ ළමයින් ඉගෙන ගනීවි යන විශ්වාසයෙනි.

දෙමාපියන්ගේත් ගුරුවරුන්ගේත් විශ්වාසය රැකුණ තැන එකිනෙකා කෙරෙහි ආදරයක් ඇති වෙනවා. ඒ ආදරය නිසා සාමය ඇති වී ලොව ලස්සන වෙනවා.

අපේ දියුණුවට වැඩ කරන පරාර්ථකාමී අනුකම්පා හිත් ඇති ගුරුවරුන් ද දුර්ලභයි.

ජනහිතකාරී දයාපන්න අපේ ජාතියට ද අපේ රටට ද හිතැති ජනප්‍රධානයන්වත් ධන සම්පත් ඇති නිර්ලෝභී ත්‍යාගවතුන්වත් අප අතර නැති බැවින් සිංහල මහා ජනකාය පිරිහෙන්නේ ය.

**ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමා**



# ඔවදන් මිණි වැළ

බම්බලපිටියේ සිරි වජිරාරාමවාසී ත්‍රිපිටකාචාර්ය
**පූජ්‍ය වේරදූවේ මහින්ද හිමිපාණන් විසිනි**

හිමිදිරියේ අවදිවන්න පතුරා මෙත් සිත සැමහට
තම කටයුතු නොපමාව ම කළ යුතු මැළිකම් දුරුකොට
නමා මුදුන් දෙපා නැමඳ මවුපියන්ට බුහුමන් කොට
පාසල වෙත පිය නඟන්න සිනහ මුවින් ඔබ හැම විට

ගුරු සිත රිදවන්න එපා කිසි විටෙකත් දරුවනේ
දැනුමෙන් හොඳහැටි වැඩෙන්න සිප් ගැන සිත් බඳිමිනේ
මවු පිය වැඩිහිටි අය දෙන හොඳ ඔවදන් රකිමිනේ
නැණවත් ගුණවත් දරුවෙකු වෙන්න ඔබත් හැමදිනේ

නරක යහළුවන් කිසිවිට එපා ඔබේ ළඟට ගන්න
හොඳම යහළුවන් සැමවිට ඇසුරට හොඳ බව සිතන්න
වැඩිහිටි උදවියත් එක්ක එපා එකට එක කියන්න
හැම දෙන ආදරය කරන යහපත් සුරුවෙකුම වෙන්න

සවසට මල් පහන් තියා බැතියෙන් බුදුහිමි වඳින්න
පවකට සිත නොදෙන බවට තරයේ අදිටන් කරන්න
මුල්කොට ගෙන පිවිතුරු සිත ලෝ සතුනට මෙත් වඩන්න
නින්දට යන්නට මත්තෙන් බුදුගුණ සිහිපත් කරන්න



# සැප නින්ද

**පූජ්‍ය පමුරන මෙත්තෙය්‍ය හිමිපාණන් විසිනි**

දරුවාට සැප නිදි ලැබේවා !

'බුද්ධං සරණං ගච්ඡාමි ! ධම්මං සරණං ගච්ඡාමි ! සංඝං සරණං ගච්ඡාමි ! 'යි කියා උතුම් වූ තෙරුවන් සරණ යන දරුවන්ට සැප නිදි ලැබේවා !

සියලු සත්ත්වයෝ සුවපත් වේත්වා ! යි භාවනා කරන දරුවනට ද සැප නිදි ලැබේ.

පින්කරන දරුවනට පෙනෙන සිහිනත් සැප ය. නිතර පින්කරන හොඳ දරුවනට සිහිනෙනුත් පින් ය.

හොඳ දරුවෝ සිහිනෙනුත් පන්සැලට යති. සිහිනෙනුත් චෛත්‍ය රාජයන් වහන්සේ සහ බෝධීන් වහන්සේ වදිති. මල් හා සුවඳ පුදති. සිල් සමාදන් වී බණ අසති. අම්මා තාත්තා වදිති.

තව ද දරුවන් නිදා ගන්නා විට කරුණා මෛත්‍රී දෑතින් ලෝකයේ සියලු සතුන් තමන් වෙතට ගෙන සිඹ තුරුල් කරගෙන නිදන්න.

එවිට දරුවන්ට කිසි සතකුගෙන් කිසි පීඩාවක් නොවේ.

බෝසතා කෝ ?'' කියා කුකුළා හඬලන අරුණෝදය වේලාවේත් දරුවා එරමිණියා ගොතා ඇදේ වාඩි වී තුරුණුවන් සරණ ගොස් පන්සිල් සමාදන් වී සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා යි භාවනා කරන්න.

ඉන්පසු සිහිනෙන් පින් කළා වගේ සැබැවිනුත් පින්කම් කරන්න.

දරුවා වාගේ ම දරුවාගේ ගෙදර සහ ගමේ හැමදෙනත් සුවසේ නිදා සුවසේ පිබිදා සව් සතුන් සුවපත් කිරීම සඳහා වැඩ කරත්වා !

**සබ්බේ සත්තා භවන්තු සුඛිතත්ථා !**



# LOVING HOME

If the world was perfect, the streets so clean,
The grasses green, and no one mean,
Imagine what we all could be!
From superstars with flying cars,
To engineers on planet mars;
With no one harmful to anyone,
and peace and safety for everyone.

But the world we made is but perfect;
Neither clean, nor green, nor seen without mean.
A flower's seed grows in pot of greed,
A selfish nest of an evil breed.
And to sprout and bloom out in the sun,
It must fight a wall of hate and mud.

What can we do to save this flower?
And all the others that will join the hour?
There is no magic up in the sky
That can change the world from up so high;
But with the power within ourselves,
We can make a change like an army of men.

Hatred is a plague, you say?
Well, infest the place with love instead.
Take avarice away with a share of kindness
And insolence with a bundle of respect.
Be courteous, polite, and honest, and nice,
Whether it be your mother or spouse,
Or to a stranger or a mouse.

With the effort of each and every one of us
We can work together with infinite strength.
A massive army of lasting heroes,
We can pull our world from such drowning depths.
Each person is each important string
Of the giant blanket we shall weave.
Let us wrap our wonderful world
With warmth and happiness,
A loving home.

**Chathuri Wickramaratne**
Grade 12, Dulles high school
Math and Science Academy
Texas , USA